

# සංක්‍රමණිකයකුගේ සටහන

## නිදහස

අප පාසල් යන අවදියේ අපට දැන ගන්නට සලස්වනු ලැබුයේ අපට සැබෑ ලෙසම නිදහස ලැබුනේ පෙබරවාරි 04 දාක නොව මැයි 22 දාක බවයි. ඒ ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූ නිසයි. 1948 පෙබරවාරි 04 යනු අර්ධ වශයෙන් නිදහස ලැබු දිනයක් ලෙසයි. ඒ දිනවල පිලිගත්තේ අපේ රටේ රාජ්‍ය පාලනය පාට මාරුවීමත් සමග නිදහස් සැමරීම මේ දින දෙක තුළ දෝලනයවීමේ ප්‍රතිපලයක් ලෙස මැයි 22 දැන් මිනිස්සුන්ට අමතක වී ගිහින්. ඒ කොහොම උනත් දැන් ඇති වෙලා තියෙන තත්ත්වයක් එක්ක අපිට ඇත්තේ ''නිදහස සැමරීමේ'' නිදහස ඇරෙන්න වෙන මොන නිදහසක්ද? කියලා තේරුම් ගන්න අමාරුයි. සමාජ, ආර්ථික, දේශපාලනික වශයෙන් අපි නොරටට බැදිලා තියෙන තත්ත්වයේ හැටියට අපි මේ සමරන්නේ නිදහසක් නොවෙයි. ඒක චාරිත්‍රයක් ඉටු කිරීමක් පමණයි. ඒකවත් අපිට එකට එකතුවෙලා කරන්න බැරි තත්ත්වයක් තුළ නිදහස ගැන කුමන කථාද? නොරටක ඇවිත් එකම නගරයක් තුළ දෙකට තුනට බෙදිලා අවුරුදු 59ක් තිස්සේ වයන තැටිය අහල, බෙර ගහලා නටලා ''නමෝ නමෝ'' කියලා විසිරිලා යනවා. අඩුම තරමේ ඊලග පරම්පරාවටවත් ''නිදහස'' ගැන නිදහස ලබා ගැනීමේ මාර්ගය ගැන තේරුම් කර දෙන්න වැඩපිළිවෙලක් සකස් වෙන්නේ කවදාද? කවුරුන්ද?

## - ASSET-

කලකට පසු Asset සංවිධානය ගැන තොරතුරක් දැන ගන්නට ලැබුනා. වසර දෙකක පමණ පෙරදී ශ්‍රී ලංකාවේ වැඩි ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට උරදීමේ පවිත්‍ර චේතනාවෙන් ඇරඹුන මේ සංවිධානය ඇතැමුන්ගේ කුමන්ත්‍රණ තුළ තාවකාලිකව නිහඬ වුවත් සුනාමි ව්‍යවසනය හමුවේ ඔවුන කළ අපරිමිත කැපවීම අපට තවමත් මතකය. ලදරු සංවිධානයක් ලෙස එහිදී ඔවුන් කල වැඩ කොටස බොහෝ ප්‍රබල සංවිධානවලටද අභියෝගයක් උනා. ශ්‍රී ලංකාව තුළ ඇතිවුන දේශපාලනික පෙරලි තුළ ඔවුන්ගේ මුලික අරමුණු යටපත් වුවත් මෙවර ඔවුන් තවත් එවැනි අගනා කටයුත්තකට මුල පුරා තිබෙනවා. ඒ ශ්‍රී ලංකාව තුළ කිරි ගම්මාන නැංවීමේ ව්‍යාපෘතියකට හවුල් වෙමින්. දිවයින තුළ තෝරාගත් කිරි ගම්මානවල වැඩ කටයුතු වලට උපකාර කිරීම ඔවුන්ගේ අභිප්‍රායයි. මේ සද්කාරය සඳහා ඔවුන් මෙල්බන්වාසී ඔබ සියලුදෙනාගේම ආධාර උපකාර බලාපොරොත්තු වෙනවා. නුදුරේදීම ඔබට ඒ පිළිබඳ විස්තර දැන ගන්නට ලැබේවි. යහපත් දේකට උපකාරීවීම යහපත් මිනිසුන්ගේ යුතුකමක්.

## දේදුණු ආණ්ඩුව

මේ පාට පාට ආණ්ඩුව ගැන මොනවා කථා කරන්නද? මොනවා ලියන්නද? ලියන්න ඇත්තේ මහින්ද, ගෝඨාභය, සරත් ෆොන්සේකා හා හමුදා සෙබලු ගැන පමණයි. මහින්ද කෙසේ වෙතත් ඉතිරි තුන් කොටස නැත්නම් ආණ්ඩුවක් නැති වගක් තමයි දැන් ඇති වෙලා තියෙන්නේ. ජීවත් වෙන්න රටක් ඕනෙ තමයි. රට බේර ගන්න යුද්ධ කරන්නත් ඕනෙ තමයි. යුද්දෙන් පස්සේ රට හදන්නත් එපායැ. මහින්ද කා එක්කද මේ රට හදන්න ලෑස්ති වෙලා ඉන්නෙ. එකතු වෙලා ඉන්න කට්ටිය නම් අපුරුයි. චින්තලේ ඉරි තැලිලා කියලා අපි කිව්වේ මීට මාස 08කට විතර පෙරදියි. බලන් ඉටු මොකද වෙන්නේ කියලා. දේදුන්න ආකර්ශනීය දර්ශනයෙන් පස්සේ ඉතිරි වෙන්නේ හිස් අහස විතරක් බව අපි හැමෝම දන්න සත්‍යයක්.

## කස්ත්‍රෝ

කියුබාව හා කස්ත්‍රෝ යනු දෙකක් නොව එකක්. මේ ගැන ලියන්න හිතුවේ කස්ත්‍රෝ සහෝදරයා සුවවී යළිත් ජනතාව අතරට ආ බව දැන ගන්නට ලැබුන නිසයි. මාස දෙක තුනකට පෙර කස්ත්‍රෝ මිය යාවී යැයි සිතූ ඇමරිකාව හැසුරුනු අයුරු අපට මතකයි. මෙවරත් ඇමරිකන් පැතුම සුන්වෙලා. කවුරු කොහොම අර්ථ දුන්නත් ලොව දීර්ඝතම කලක් රාජ්‍ය පාලනය කළ නායකයා වුයේ ඔහුයි. 1959ට පෙර පසුගාමී රටක්ව තිබු කියුබාව ලෙඩ රෝගවලින්, යාචකයන්ගෙන්, නුගත් කමින් පිරුනු කියුබාව ඒ තත්ත්වයෙන් මුදාගෙන නූගත්කම, දිළිඳුකම, විරැකියාව රටින් තුරන් කර ලොව හොඳම වෛද්‍ය සේවාව පවත්වාගෙන යන රටක් බවට පත් කළේ කස්ත්‍රෝ ඇතුළු නායකයින්. මේ සියලු ජයග්‍රහණ ඔවුන් ලබා ගත්තේ දශක ගණනාවක් ඇමරිකාව ප්‍රමුඛ රටවල් පනවා තිබු වෙළෙඳ සම්බාදක මැද බවත් අමතක නොකල යුතුයි. සමාජවාදී රාජ්‍ය බිඳ වැටීමෙන් හුදකලා වුන කියුබාව අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට හසු නොවුයේ කස්ත්‍රෝගේ නොසැලෙන නායකත්වය නිසයි. ඔහු ලොව වෙසෙන සියලු සටන්කාමීන්ට ආදර්ශයක්. ''සමාජවාදය නැතිනම් මරණය'' ඒ ඔහුගේ සටන් පාඨයයි. මේ අසාමාන්‍ය සටන්කාමී නොසැලෙන නායකයාට පූර්ණ සුවය අපිද පතන්නෙමු.

## ගුවන් විදුලි කථා

දශක දෙකක පමණ කාලයක් පුරා ශ්‍රී ලංකාව තුල පැතිරී ගිය එෆ්.එම්. සංස්කෘතිය දැන් වෙනස් මඟක් ගෙන ඇති බව පෙනෙන්නට තිබෙනවා. හුදු ජනප්‍රියතාව, ලාභය හා පහසුව උදෙසා භාවිතා කළ උපක්‍රම දැන් ජනතාව ප්‍රතික්ෂේප කර අවසන්. **දැන් ලංකාවේ එෆ්.එම්. සේවා ගමන් කරමින් සිටින්නේ නව මගකය. භාෂා සංස්කෘතිය සාරධර්ම රැකීමට අද පළමු තැන හිම්වෙමින් තිබෙනවා.** අලුතින් ඇරඹී ඇති එෆ්.එම්. සේවා ඊට කදිම නිදසුන්.

ලංකාවේ එෆ්.එම්. සේවා මගින් ඉවත දමන ලද දේ මෙහි ගෙනැවිත් පුරුද්දන්නට උත්සාහ දැරීම කණගාටුවට කරුණක්. ව්‍යක්ත භාෂාව වෙනුවට කථා කරන භාෂාවෙන් කටයුතු කිරීම දැන් යල් පැනපු දෙයක්. ජනතාවගේ මුදලින් පෝෂණය වන ජනතාව විසින්ම පත්කරන නියෝජිතයන්ගෙන් පාලනය වන ගුවන් විදුලියක මේ දේ වීම අප වළක්වා ගත යුතුයි. ඒ නිසා නැවතත් ලියන්නේ ''කෑවෙමි''ට වඩා ''කෑවා'' යන්නත් ''ගියෙමි'' ට වඩා ''ගියා'' යන්නත් හරි ලේසියි. ඒ වගේම තමයි ''ඔහු කිසි දෙයක් තේරුම් නොගනිති'' යන්නට වඩා ''ඌට කිසි දෙයක් තේරෙන්නේ නැහැ'' කියන එකත් ලේසියි. පොඩ්ඩක් හිතලා බලන්න.

තමන්ගේ නොහැකියාව හා මුග්ධ කම ප්‍රදර්ශණය කරනවාට අමතරව ඒ මුග්ධ ක්‍රියාව සාධාරණීකරණයට තැත් කිරීමත් කෙතරම් හාස්‍ය ජනද ද?

**QLinkQ වෙතින් ඩයලොග් ග්ලෝබල් දුරකථන කාඩ් පත් දෙකක් ඔබට**

# The Challenge

විවේකයට විනෝදයට මේ අභියෝගය විසඳන්න. A රූපය හා B රූපය බැලූ බැල්මට එක හා සමාන ය. නමුත් A රූපයේ නැති වැරදි 10 ක් B රූපයේ ඇත. හැකි නම් ඒ වැරදි 10 සොයාගන්න. B රූපය මත ඒ වැරදි රවුමකින් ලකුණු කරන්න. එසේ ලකුණු කළ B රූපය කපා අපට එවන්න. නිවැරදි විසඳුම් අතරින් තෝරා ගන්නා දෙදෙනෙකුට **QLinkQ** වෙතින් ග්ලෝබල් ඩයලොග් දුරකථන කාඩ්පත බැගින් හිමි වෙයි. අපේ ලිපිනය The Challenge Sannasa 22 Lorne Street Lalor Vic 3075

**පිළිතුරු එවූ අය අතරින්**

Nirosha Weerasuriya Clayton
චාර්ල්ස් පියසිරි Glen Waverley
Jagath manatunga Strathmore
Esther Nishamani Hallam
රුවිනි ලක්මාලි Burnside
කාන්ති ගලගෙදර Glen Waverley
Kaveen Amarakoon Thomastown
Chandima Adikari Craigieburn
දිලානි ද සිල්වා Glen Waverley
U S Priyanthi Dandeniong


*සිතුවම - සුනිල් කුමාර අමරකෝන්*

<u>ගිය මාසයේ ජයග්‍රාහකයෝ</u>

**තිසල් සුචින්ත පොල්ගම්පලගේ**
22 Hampton St Durack Qld 4077

**පුණ්‍යා කෑරගල**
1/7 Chinnock Court Craigieburn Vic 3064

**ගියවර විසඳුම**



A



B



නම ....................................................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න).......................................................

.............................................................................................